


## නිදහස

තවත් නිදහස් දිනයක්
පසුවිය. නිදහස නමින්
යමක් සුද්දා අපට දී
ගියත් සැබැවින්ම අපි
නිදහස් ද? අවුරුදු
සිය ගණනක් වහල්
ජාතියක්ව සිටීම නිසා
දෝ පරගැති බව අපේ
ලේ මස් නහර තුළට
පවා කාවැදී ඇති
ආකාරය අපි අදත්
අත් නොදකිමු ද?

මේ පරගැති
මානසිකත්වයෙන් අප
අත්මිදෙන්නේ කවදා ද
අන්න එදිනට සැබෑ
නිදහස සමරමු. එතෙක්
නිදහස් දිනය නම් වන
ව්‍යාජය සමරමු.








**අනුර හොරේෂස්**

# බෝම්බ පිපිරවීම ව්‍යාපයට වාසියක්

**මොනවා හරි** ප්‍රශ්නයක් විසඳා ගත්තට පස්සේ ''අපි සාමයෙන් ජීවත් වෙමු'' යි කියලා කියනවා. බලාගෙන යනකොට 'සාමය' කියන වචනයට තිබෙන්නේ අකුරු තුනක් වුණාට ඒකේ තේරුමේ දිග පළල මනින්න නම් හරිම අමාරුයි. රටට සාමය රැගෙන එන්න ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා දරන්නේ අප්‍රමාණ උත්සාහයක්. එතුමා සාමයේ දෑත ප්‍රභාකරන්ට දිගු කරද්දී කොටි නායකයා උගේ නපුරු නියවලින් රාජපක්ෂ මැතිතුමාගේ දෑත සූරනවා. හපා කන්නත් බලනවා. නපුරු කොටියා කොහෙ-ාම හරි බලන්නේ රාජපක්ෂ මැතිතුමාව කෝපයට පත් කරවන්න. ඔහු කෝපයට පත්කරවා හමුදා බලසේනා හරහා යුද්ධයක් පටන් ගන්න. ඒත් සාමය කියන වචනයේ බලමහිමය දන්නා ජනාධිපතිතුමා කොටියාගේ නපුරු නියපහර වලින් පීඩා විඳිමින් සාමයේ දෑතම ප්‍රභාකරන්ට යොමු කරනවා. ත්‍රිවිධ හමුදාව හා පොලීසිය සන්සුන් කරවමින් සාමය වෙනුවෙන්ම කැපවන ලෙසට ඔවුන්ට උපදෙස් දෙනවා.

ඉතින් මෙන්න මේ වගේ අප්‍රමාණ උත්සාහයක් සාමය වෙනුවෙන් ජනාධිපතිතුමා දරණ කොට එතුමාට හැකි පමණින් සහය දීම කාගේත් යුතුකමක් වගේම ජාතික වගකීමක්. ඒත් දැන් සිද්ධ වෙමින් තිබෙන්නේ ඊට පටහැනි දේවල් බවයි මගේ වැටහීම.

උතුරු නැගෙනහිරට සාමය රැගෙන එන්න ජනාධිපතිතුමා ධෛර්‍යය දමන කොට සමහරු දකුණේ කලබල ඇති කරන්න හදනවා. ඒ කියන්නේ කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බෝම්බ පුපුරවනවා. පසුගිය 24 වැනිදා රාත්‍රී 8.30 ට පමණ කොළඹ තැනින් තැන බෝම්බ හතරක් පහක් පුපුරුවා හැරියා. කොළඹ කාසල් රෝහල අසළ, නුගේගොඩ දුම්රිය පොළ අසළ, කිරිබත්ගොඩ බස් නැවතුම් පොළක හා ගල්කිස-'ස සංචාරක හෝටලයක් අසල මෙම බෝම්බ පිපිරවීම් සිදු කළා. හැබැයි කිසි කෙනෙක්ට අනතුරක් සිදු වූ බවක් වාර්තා වුණේ නැහැ. පොලීසිය හා ජාතික රහස් ඔත්තු සේවා කළ සොයා බැලීම්වලදී හෙළිදරව් වුණේ මේ බෝම්බ පිපිරවීම් සිදු කළේ කොටි සංවිධානය නොවන බවයි. එහෙම නම් කවුද මේ බෝම්බ පිපිරවීම් කළේ.
බෝම්බයක් කියන්නේ සෙල්ලම් බඩුවක් නෙවෙයි-නේ. කොළඹත්, තදාසන්න පළාත්වලත් පසුගිය කාලයේ කොටින් පුපුරුවා හැරිය බෝම්බ වලින් ජීවිත විනාශ වුණේ දහස් ගණනින්. බෝම්බ වලින් ජීවිත විතරක් විනාශ වෙලා නතර වුණේ නැහැ. සමස්ත ජන ජීවිතය පුරාම මහා බියක් පැතිරුණා. ජනතාව විසිහතර පැය පුරාම ජීවත් වුණේ තිගැස්සීමෙන්. කම්පනයෙන්. ළමයි පාසල් ගියේ නැහැ. උදේ රැකියාවට ගිය සැමියා සවස ගෙදර ආවේ නැහැ. බස් රියේ, දුම්රියේ ගමනක් බිමනක් යාම මරුවා හමුවට යාමක් වශයෙන් එදා ජනතාව කල්පනා කළා. කොටින්ම කියනවා නම් කොළඹ පැත්ත පළාතේ යන්න ජනතාව බිය වුණා.

ඒ බිහිසුණු වාතාවරණය අවසන් වුණේ ජීවිත සිය දහස් ගණනක්, රුපියල් කෝටි ගණන් වටිනා දේපොල අහිමි වුණාට පස්සේ. ඊට පස්සේ සාමයෙන් හුස්ම ගන්න ජනතාවට පුළුවන් වුණා. ඒ සාමයේ සුවය විනාශ කරන කැත දේශපාලන අරමුණක් 24 වැනිදා බෝම්බ පිපිරවීම පසුපස තිබෙන බවයි මට නම් පෙනෙන්නේ. මෙම බෝම්බ පිපිරවීමෙන් ජනතාවට අනතුරක් නොවුණත් කොළඹ තිබුණ සාමය මෙම බෝම්බ වලින් පුපුරා ගිය බවයි මගේ විශ්වාසය. මේ වෙනකොට දකුණේ, කොළඹ ජනතාව ජීවත් වෙන්නේ තිගැස්සීමෙන්. චකිතයෙන් හා කම්පනයෙන්. ඒ මීළඟ බෝම්බය කොතැන, කීයට පුපුරා යාවිදැයි යන සැකයෙන්.

මෙම බෝම්බ පිපිරවීමට ආසන්නම හේතුව මොකක්ද? ආරංචි මාර්ග පවසන්නේ බෝම්බ පුපුරවා තිබෙන්නේ සෝල්ලහයිම්ට විරෝධය පළ කරන්නට බවයි. නෝර්වේ විශේෂ සාම නියෝජිත එරික් සෝල්හයිම් ශ්‍රී ලංකාවට පැමිණීමත් 24 වැනිදා ඔහු කොටින් සමග සාකච්ඡා කරන්නට කිලිනොච්චිය බලා යාමත් ඊට විරෝධය පළ කිරීම අරමුණු කර ගෙනත් මෙම බෝම්බ තැනින් තැන පුපුරවා හැරිය බවයි ආරංචි මාර්ග සඳහන් කළේ. ඒ වගේම මඩකලපු සටන් විරාම නිරීක්ෂණ කමිටු කාර්යාල භූමියෙත් බෝම්බයක් පුපුරවා හැරියා. සටන් විරාම

<u>එදා ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ අරගලය මර්ධනය කොට විශාල පිරිසක් ඝාතනය කිරීමට මුල් වුණේ නාඳුනන සන්නද්ධ කල්ලියි. මෙම කල්ලි කහ බළල්ලු, කලු බළල්ලු, ප්‍රා යන නම් වලින් එදා හැඳින්වුණා. ඔවුන් විසින් මරා දැම්මේ ජවිපේ ක්‍රියාකාරිකයන් පමණක් නොවේ. තමන්ගේ දේශපාලන පක්ෂයට, දේශපාලන අරමුණුවලට නොගැලපෙන පුද්ගලයන්ද මෙම සන්නද්ධ කල්ලි අතින් මැරුම් කෑවා.</u>

නිරීක්ෂණ කමිටුවේ ප්‍රධාන හග්රූප් හෝක්ලන්ඩ් කියා සිටියේ මෙම බෝම්බය පුපුරවා හැරීමට කොටි සංවිධානය හෝ රජය සම්බන්ධ නැති බවයි. එහෙම නම් කවුද මේ බෝම්බ පුපුරවන්නේ.

මේ අතර තවත් අනතුරක පෙරනිමිත්තක් ගැන වාර්තා වෙනවා. උතුරේ සහ නැගෙනහිර වෙනම සන්නද්ධ කල්ලි බිහිවීමයි ඒ අනතුරුදායක පෙරනිමිත්ත. මෙම සන්නද්ධ කල්ලි බිහි වී තිබෙන්නේ දකුණේ පක්ෂ දෙකක් හා කරුණාගේ පිලේ සහභාගීත්වයෙන්. ඔවුන්ගේ අරමුණ වී තිබෙන්නේ කොටි සංවිධානයට පහර දීමයි.
මේ තත්ත්වය තුළින් සිහිපත් වන්නේ 1988 / 89 භීෂණයයි. එදා ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ අරගලය මර්ධනය කොට විශාල පිරිසක් ඝාතනය කිරීමට මුල් වුණේ නාඳුනන සන්නද්ධ කල්ලියි. මෙම කල්ලි කහ බළල්ලු, කලු බළල්ලු, ප්‍රා යන නම් වලින් එදා හැඳින්වුණා. ඔවුන් විසින් මරා දැම්මේ ජවිපේ ක්‍රියාකාරිකයන් පමණක් නොවේ. තමන්ගේ දේශපාලන පක්ෂයට, දේශපාලන අරමුණුවලට නොගැලපෙන පුද්ගලයන්ද මෙම සන්නද්ධ කල්ලි අතින් මැරුම් කෑවා. ඉන් නොනැවතුන මෙම මැර කල්ලි තමන්ගේ පුද්ගලික එදිරිවාදිකම් අනුවත් අහිං-සකයන් මරා දැම්මා. අද කොටින්ව මරා දැමීමට එල්ල කරන මෙම තුවක්කු අනාගතයේදී දකුණේ විරුද්ධ දේශපාලන මත දරණ පුද්ගලයන්ටත් එල්ල නොවේ යැයි කාට කියන්න පුලුවන්ද?

මේ වගේ උණුසුම් වාතාවරණයක් හරහා අප්‍රසාදයට පත්වන්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයයි. එතුමාගේ කීර්ති නාමයයි. එහෙම වන්නේ කොහොමද?

ප්‍රභාකරන් ඇතුළු ඔහුගේ මිනිමරු හමුදාව වනසා දමන්නට යුද්ධයක් ඕනෑ යයි කියන පිරිසක් ද වෙති. ඒත් එහෙම කියන කාගේවත් පවුලේ කෙනෙක් යුද්ධ කරන්නට යන්නේ නැත. යුද වදින්නේ රටේ දුප්පත් ජනතාවාගේ පුතුන් ය. ඒ තරුණයන් යුද හමුදාවට හා පොලීසියට බැඳී ඇත්තේ දුප්පත්කම නිසා ය. රටේ වෙනත් රැකියා ඔවුන්ට නොලැබුණ නිසාය. ඔවුන් හම්බ කරන වැටුපෙන් දිවි ගැටගහ ගන්නේ දුප්පත් වයසක දෙමව්පියන් ය. මෙම තරුණයන්ගේ මළ කඳන් සීල් කරපු මිනිපෙට්ටි වලින් ගෙනෙන කොට දුප්පත් දෙමව්පියන් රජයට සාප නොකර සිටීවිද? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතඳමා යුද්ධයක් පටන් අරගෙන අපේ දරුවන් මරා ගත්තා යැයි කියමින් ඔවුන් විලාප නොදී සිටීවිද?

එම බිහිසුණු ඉරණම ගැන අත්දැකීම් තිබෙන ජනාධිපතිතුමා කොටි ප්‍රභාකරන්ගේ ප්‍රහාර තවදුරටත් ඉවසමින් සිටින්නේ සාමයට ඇති කැමැත්ත නිසාය. ඒ අතරේ කොළඹ බෝම්බ

4 වන පිටට


**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0439 925 241 |
| **SA** Chandta Eeriyagama 08 8331 2318 | **TAS** Anura Seneviratne 03 6327 4259 |

**සන්නස පිරිවර**

| | |
|---|---|
| අනුර හොරේෂස් | Anura Horetious |
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| ඩබ් ක ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| චන්දි මාපා | Chandi Mapa |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |

සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569